------------------------------------------------------------

**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල ප්‍රාදේශීය සභාව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 17 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) ප්‍රාදේශීය සභාවට අයත් කැබ් රථයක් රු.500,000 කට විකිණිය හැකි යැයි උපකල්පනය කර එම මුදල 2010 වර්ෂයේදී ණයගැති ගිණුම හර කොට ආදායම් වියදම් ගිණුමට බැරකර තිබුණි. මෙම කැබ් රථය 2013 අප්‍රේල් 18 දින වන විටත් නිශ්කාර්ය වත්කමක් වශයෙන් භෞතිකව පැවැති බැවින්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැතියන් හා වර්ෂයේ ආදායම රු.500,000 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය හා ස්ථාවර වත්කම් ගිණුම් අතර රු.6,000,000 ක වෙනසක් විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් නොකරන ලද කර්මාන්ත 22 ක් සඳහා රු.4,875,807 ක් වූ ණයහිමියන් ගිණුම් වල දක්වා තිබූ බැවින්, ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.17,033,010 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.510,186 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 777,725 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 1,381 | 1,549 | 540 |
| (ii) | බදු කුලී | 834 | 841 | 860 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 554 | 743 | 80 |
| (iv) | වෙනත් ආදායම් | 4,298 | 3,810 | 1,995 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 696,241 |
| (ii) | මුද්දර ගාස්තු | 1,237,200 |

#### 2.2.3 පරිසර බලපත්‍ර

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බලප්‍රදේශයේ පවතින කර්මාන්ත, ව්‍යාපාර සමීක්ෂණයක් මගින් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) සභාවේ ලේකම් තනතුර සඳහා පත්කර තිබුන විශ්‍රාමික රජයේ නිලධාරියෙකුට 2007 මැයි 11 දින අංක 09/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 2(v) වගන්තියට පටහැනිව 2010 පෙබරවාරි සිට 2013 ජනවාරි දක්වා වැටුප් වශයෙන් රු.56,667 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (i) වගන්තිය අනුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබානොගෙන සභාව විසින් 2012 වර්ෂය තුලදී දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ආදේශක/තාවකාලික සේවකයින් 05 දෙනෙකු බඳවාගෙන වැටුප් හා දීමනා වශයෙන් සභා අරමුදලින් රු.515,869 ක් ගෙවා තිබුණි.

## 2.4 කොන්ත්‍රාත් පරිපාලනය

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේ දී අදාල සංවිධානයේ බැංකු සහ මූල්‍ය පහසුකම් සනාථ කරගැනීම, සමාන වැඩ පිළිබඳව පළපුරුද්ද හා ඒවායේ ප්‍රමිතිය පිළිබඳ සෑහීමකට පත්විය හැකි සාක්ෂි, ලබා නොගෙන සභාව විසින් සමිති සංවිධාන වෙත කොන්ත්‍රාත් පවරා තිබුණි.

## 2.5 මෙහෙයුම් අකර්යක්ෂමතා

(අ) කොස්ලන්ද වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාගත් රු.5,000,000 ක ණය මුදල වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලට 2012 දෙසැම්බර් වන විට පොලී වශයෙන් රු.1,432,633 ක් හා ණය වාරික රු.508,112 ක් වශයෙන් එකතුව රු.1,940,745 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. වසර 03 ක පමණ කාලයක් ගත වුවද, මෙම වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් ලබාගත හැකිව තිබූ කුලී ආදායම අහිමිවී තිබුණු අතර, සභා අරමුදලින් පොලී ගෙවීමට සිදුවීම හේතුවෙන් සභාවේ මූල්‍ය තත්ත්වය කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිවීමේ අවදානමක් ද පවතී.

(ආ) 2009 සිට 2012 කාලය තුල සභාව වෙත ලැබී තිබුන ගොඩනැගිලි අයදුම්පත් 120 කින් 76 කට ඉදිකිරීම් සඳහා අනුමතිය ලබාදී තිබූ නමුත්, අනුකුලතා සහතික නිකුත් කර තිබුණේ 02 ක් සඳහා පමණි. සභාව අනුමත කළ අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිකිරීම් පිළිබඳව පසු විපරම් කිරීමක් සිදුකොට සභාවට අයකරගත හැකි වරිපනම් බදු අයකර ගැනීම පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/R/2/2/3/5(4) හා 2010 මාර්තු 10 දිනැති ලිපිය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සභාවේ ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන වැඩ සටහනක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය